දිනමිණ

රස මංජරිය

රඟසොබා

සංස්කරණය - ගාමිණී ජයලත්

ජූල් පල්ලමේ චිත්‍රාගාරයක් ඉදිවෙයි

විදේශීය ටෙලි නාට්‍ය විකාශය සඳහා වන ආනයන බද්ද ඇසුරින් රූගත කිරීමේ ගම්මානයක් හම්බන්තොට තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් 'ජූල් පල්ලම' ගම්මානයේ ඉදි කිරීමේ කටයුතු අගෝස්තු මස ආරම්භ කිරීමට දැනටමත් කටයුතු සූදානම් කොට ඇත. අඩු වියදමකින් හොඳ මට්ටමේ ටෙලි නාට්‍ය සහ චිත්‍රපට රූගත කිරීම අරමුණු කොට ගනිමින් අක්කර 365 ක් පුරා ඉදි කිරීමට නියමිත මෙම ගම්මානය අදියර කීපයක් යටතේ නිම කිරීමට නියමිතව ඇත. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මග පෙන්වීම හා උපදේශකත්වය මත ජනමාධ්‍ය අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඉදි කරන්නට නියමිත මෙම රූගත කිරීමේ ගම්මානය සරල ලෙස පටන් ගෙන සියලු අංගෝපාංග සහිත චිත්‍රාගාරයක් බවට පත් කිරීම රජයේ අරමුණ වී ඇත.

> “මට අත් විඳින්නට සිදු වූ සිදුවීම් ඒ වගේ ම අවට සිටින පුද්ගලයන්ට අත් විඳීමට සිදු වූ සිදුවීම් සහ අනාගතයේ දී අප සියලු දෙනාට ම සිදු වන සිදුවීම් තමයි මේ නාට්‍යයෙන් ප්‍රතිනිර්මාණය කරලා තියෙන්නේ.”

සංකීර්ණ සමාජයේ 'හරි අපූරු දවස'

ජාතික නාට්‍ය උළෙල 2008
NATIONAL DRAMA FESTIVAL

ඒක ලයාන්විතව ගැයෙන මිහිරි කවියක්.
නෑ.
ඒක ගීතයක්.
කමක් නෑ. කවියක් වුවත් ගීයක් වුවත් හරිම මිහිරියි.
අපේ ජීවිතය වගේ.
අපිට තිබුණේ බලාපොරොත්තු විතරයි.
ඒක ගීතයක්.
හැබෑ වෙන ගීතයක්.
අතේ තිබුණේ රු. 171.50ක් විතරයි.
අපි දෙන්නා හමුවෙන සුන්දර ම දවස ඉරිද,
අපි ගොඩාක් ප්ලෑන් හැදුවා.
ඉරිද සුන්දරව ගත කරන්න
බලමු.
අපේ ප්ලෑන්වලට මොකද වෙන්නේ කියලා.

ඔහු වාමික. වාමික ගත්ලනවත්ත. කැලණිය විශ්වවිද්‍යාලයේ නාට්‍ය හා රංග කලාව පිළිබඳ විශේෂවේදී ශාස්ත්‍රපති උපාධිධරයෙක්. ඔහු 1997 වර්ෂයේ දී සරසවිපාය නාට්‍ය හා රංග පාසැලේ රංග කලාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරී ය. එහි දී හඳුනාගත් සමකාලීන සහෘදයන් සමග එක් වී නාට්‍ය හා රංග කලාවට අවශ්‍ය මූලික පදනම සකසා ගත්තේ ය. අනතුරුව 1998 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වූයේ ය. තම අධ්‍යයන විෂයට අදාළව ඉන්දික ෆර්ඩිනැන්ඩු, චතුරාණි තිලකරත්න යන අය සමග එක් වී රාජ්‍ය ළමා නාට්‍ය උළෙල වෙනුවෙන් නාට්‍යයන් නිර්මාණය කෙළේ ය. ඒවා බොහෝමයක් අවසන් නාට්‍ය වටයට තේරිණි.

අවසන් වසරේ පරීක්ෂණය වෙනුවෙන් ඉදිරිපත් කෙළේ තෙඩිනා වේදිකා නාට්‍යයයි. එම නාට්‍යය රාජ්‍ය නාට්‍ය උළෙලේ අවසන් වටයට තේරිණි. වාමික ගත්ලනවත්තට 2003 වර්ෂයේ හොඳ ම නළුවාට හිමි සම්මානය ලැබිණි. එම නාට්‍යයම ඉන්දියානු අන්තර් ජාතික නාට්‍ය උළෙල සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කෙළේ ය.

ඔහු 2007 වර්ෂයේ දී 'හරි අපූරු දවසක්' වේදිකා නාට්‍යය නිශ්පාදනය කෙළේ ය. ධර්මප්‍රිය ඩයස් සහ අනුරාධා පෙරේරා විසින් ප්‍රධාන භූමිකා නිරූපණය කළහ. සංජීව දිසානායක, ඉන්දික ඩොනල්ඩ්, රුවන් මලිත් පීරිස්, මධුශාන් චතුරංග සහ සඳමාලි තෙන්නකෝන් ඇතුළු නළු නිළි පිරිසක් සෙසු චරිතවලට පණ පෙවූහ.

'හරි අපූරු දවසක්' වෙනුවෙන් සම්මානය ලබමින්....

2008 පැවැති රාජ්‍ය නාට්‍ය උළෙලේ සඳහා ඉදිරිපත් කළ මෙම නාට්‍යය සඳහා වසරේ හොඳ ම නාට්‍යය, හොඳ ම රචනය, හොඳ ම රංග වින්‍යාසය සහ හොඳ ම නිළිය යනා දී සම්මාන හිමි කර ගන්නා ලදී. එසේ ම හොඳ ම ඇඳුම් නිර්මාණය වෙනුවෙන් ප්‍රදීප් චන්ද්‍රසිරිට ද, හොඳ ම රංගාලෝකය සඳහා රංග සමරකෝන්ට ද, හොඳ ම සංගීත නිර්මාණය වෙනුවෙන් තේජ මුද්දිවික රුද්‍රිගුට ද හොඳ ම නළුවා නිර්දේශ ධර්මප්‍රිය ඩයස් ට ද හිමි විය.

මේ සියලු කාරණා පිළිබඳව වාමික ගත්ලනවත්ත සමග කළ කෙටි සංවාදයකි පහත පළ වන්නේ.

'හරි අපූරු දවසක්' හි තේමාව කුමක් ද?

රු. 171.50 කින් ඉරිද දවස ගත කරන්න සූදානම් වන පෙම්වතුන් දෙදෙනෙකු ගේ කතාවක් තමයි මෙකේ තියෙන්නේ. ඒ දෙන්නා එකතු වෙලා ලොතරැයි ටිකට් පත් විකුණනවා. අලුතින් හදන නිවාසවල ආකෘති බලන්න යනවා. කුලියට දෙන නිවාස බලන්න යනවා. සත්තු වත්තට යනවා. සංගීත සන්දර්ශනයක් නරඹන්න යනවා.

අවසානයේ දී මේ දෙදෙනාට ඉතිරි වන්නේ බලාපොරොත්තු සුන්වීම හා පසුතැවීම පමණයි. පසුව තමන්ට සිදු වූ කම අසාධාරණයකට ම විරුද්ධ ව නැගී සිටින මොවුන් අද්‍යතන සංගීත සන්ධ්‍යාවන් පවත්වන්න උත්සාහ කරනවා. ඒ සඳහා ඔබ සියලු දෙනාගේ ම අනුග්‍රහය ලබා දෙන්නැයි ප්‍රේක්ෂකයාගෙන් ඉල්ලා සිටිනවා. මේ ආකාරයට අහස උසට බලාපොරොත්තු රැසක් රඳවා ගත් අර්බුද රැසකට මුහුණ දෙන මොවුන් ගේ කතාව පුංචි කවියක් ලෙසින් ගෙත්තම් කළා. මට අත් විඳින්නට සිදු වූ සිදුවීම් ඒ වගේ ම අවට සිටින පුද්ගලයන්ට අත් විඳීමට සිදු වූ සිදුවීම් සහ අනාගතයේ දී අප සියලු දෙනාට ම සිදු වන සිදුවීම් තමයි මේ නාට්‍යයෙන් ප්‍රතිනිර්මාණය කරලා තියෙන්නේ. මෙකේ තියෙන්නේ සංකීර්ණ සමාජ දේශපාලන අර්බුදයක්.

අපේක්ෂා භංගත්වය සහ ගැටලුකාරී ජීවිතවලට මුහුණ දෙන වත්මන් සමාජයට කලා නිර්මාණයක් හරහා ලබා දෙන්නේත් එයම ද?

මේ නාට්‍යයේ සම්පූර්ණයෙන් ම තියෙන්නේ බිඳ වැටෙන මානසික මට්ටම යළි ගොඩනගා ගන්න දරණ සුන්දර උත්සාහයක්. මෙහි එන තරුණයා විවිධ ප්‍රශ්නවලින් පීඩාවට පත් වූවෙක්. ඔහු මානසිකව වැටිලා මට මාව ම එපා වෙලා යැයි පවසනවා. ඔහු ගේ පෙම්වතිය තමයි ඔහු ගේ වැටුණු මානසිකත්වය ගොඩ නැංවීමට ඔහුව පොළඹවන්නේ. ඇය පවසන්නේ ඔයාට විතරක් නෙවෙයි අද කාලේ කාටත් එහෙම තමයි. ඒත් කවුරුත් කියන්නේ නැහැ.

මන්ද මන්ද ගාමී   මන්ද
අන්ද මන්ද වී අපි   ඉන්ද
සින්ද බින්ද දුක් ගිනි   සන්ද
යන්ද අපේ පැතුමට   යන්ද

හෙමින් ගිහින් හරියන්නේ නෑ. අපේ පැතුමට අපි වේගයෙන් යා යුතුයි. අද දකින සහ අපට නිර්මාණ හරහා දකින්න ලැබෙන ආදරය විවිධාකාරයි. ඒ වගේ ම වෙනස්. මෙහි තිබෙන සුවිශේෂත්වය තමයි ප්‍රියයා ගේ බිඳ වැටෙන මානසිකත්වය නංවන්නට උත්සහ දරණ ප්‍රේමවන්තිය නිසා සුන්වීමේ බලාපොරොත්තුවේ සහ සිහින තුළ සිට බලාපොරොත්තු ඉටු වීම දක්වා යා හැකි වීමයි.

නූතනයේ රාජ්‍ය නාට්‍ය හරහා නිර්මාණකරුවන්ට ඔවුන් ගේ නිර්මාණයන් කරළියට ගෙන ඒමට ඉඩකඩ සපයනවා. රාජ්‍ය අනුග්‍රහය ද ලැබෙනවා. මේ පිළිබඳව ඔබගේ අදහස දක්වතොත්.

රාජ්‍ය නාට්‍ය උළෙලවල් සංවිධානය කිරීම හොඳයි. අපට රාජ්‍ය නාට්‍ය උළෙල හරහා හොඳ ප්‍රේක්ෂකයන් සහ ප්‍රතිචාරයන් ලැබෙනවා. ඒ වගේ ම නාට්‍ය වේදිකා ගත කිරීමට අවශ්‍ය මූල්‍යමය පහසුකම්, ශාලා පහසුකම් ලැබෙනවා. ජයග්‍රහණයන් හා සම්මාන ලබා දීම හරහා අපට නිර්මාණ ක්ෂේත්‍රයේ හොඳ පසුබිමකට යා හැකි අවස්ථා ලැබෙනවා. ඒ හරහා අපි නිර්මාණ කරුවන් වශයෙන් තව තවත් නිර්මාණ කරමින් ශ්‍රී ලංකාව පුරා ම වේදිකා ගත කළ යුතුයි කියලයි මම විශ්වාස කරන්නේ.

වේදිකා නිර්මාණ සඳහා රාජ්‍ය අනුග්‍රහය නැතැයි බොහෝ අය චෝදනා කරනවා. මේ චෝදනා පිළිබඳ ඔබගේ අදහස?

මේ පිළිබඳ චෝදනා තියෙනවා. රාජ්‍ය අනුග්‍රහය මදියි. ඒ නිසා වේදිකා ගත කරන්න බැහැයි කියා. මේ කතාවට මම එකඟ නැහැ. නමුත්, රාජ්‍ය අනුග්‍රහය මීට වඩා ලැබෙනවා නම් හොඳයි. ඒ වගේ ම අපි උත්සාහ කරන්න ඕනෑ ලැබෙන දෙයින් ප්‍රයෝජන අරගෙන නාට්‍යය කරන්න. මේ පවතින සංකීර්ණ සමාජය හමුවේ අපි කඩා වැටිලා වැඩක් නැහැ. ඒ අර්බුදයට එරෙහිව සටන් කරලා අපේ අරමුණු මුදුන් පමුණුවා ගත යුතුයි කියලා තමයි මම කියන්නේ. අපි මුළු ලංකාව පුරා ම වේදිකා නිර්මාණ, අංග රචනය, රංගාලෝකය යනාදිය පිළිබඳව උසස් පෙළ සහ නාට්‍ය හා රංග කලාව පිළිබඳව උනන්දුවක් දක්වන අය වෙනුවෙන් අධ්‍යයන වැඩසටහනක් පවත්වාගෙන යාමට සූදානම්. වැඩමුළුව අවසානයේ දී නාට්‍යයක් ද වේදිකා ගත කරන්න බලාපොරොත්තු වෙනවා. මේ විෂයයට ලැදිකමක් දක්වන බොහෝ අයට මෙය රුකුලක් වේයැයි මා විශ්වාස කරනවා.

මෙම මස 24 ද සවස දෙහිවල එස්. ද එස්. ජයසිංහ ශාලාවේදී රංග ගත කිරීමට නියමිත 'හරි අපූරු දවසක්' නරඹන්නට මම ඔබ සියලු දෙනාට ආරාධනා කරනවා.

ශතමා සමරසිංහ